## Abstract 15

# වර්තමාන සමාජය සහ බුදුදහමේ කලයාණ මිත්‍ර සංකල්පය

**ආර්. එච්, දර්ශනී සංචලා,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*darshanisanchala@gmail.com*

සමාජයක් තුළ ජීවත්වීම සඳහා සමාජයේ අවශේෂ ඒකක සමඟ ගනුදෙනුව අත්‍යවශ්‍ය සාධකයක් බව අපි දනිමු. එහි දී ඇති වන විවිධ මනෝමය අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා වෙනත් අය සමඟ පවත්වා ගෙන යනු ලබන මිත්‍රත්වය අතිශය ප්‍රයෝජනවත් වේ. වර්තමාන භාවිතය අනුව තමන් දන්නා හඳුනන තවත් කෙනෙකුන් හඳුන්වනුයේ තම මිත්‍රයෙකු ලෙස ය. එහෙත් යම් තීරණාත්මක අවස්ථාවක දී ඔහුගේ මිත්‍රත්වයේ ප්‍රමාණයට වටිනාකමක් දෙනු ලැබේ. මෙය සමාජ සන්දර්භය තුළ සදාතනික ධර්මතාවක් වේ. අත්ථක්ඛායී, වචීපරම, අනුප්පියභාණී ආදී මිතුරන් පිළිබඳ බෞද්ධ ග්‍රන්ථවල පවා නිර්ණායක සපයා ඇත්තේ එහෙයිනි. වඩාත් ම සමීප විශ්වසනීය ම මිත්‍රයා හඳුන්වනුයේ ''මගේ හොඳ ම මිතුරා'' (best friend) යනුවෙනි. බුදුදහමෙහි තම ජීවිතයට වඩාත් ම සමීප මිත්‍රයා හඳුන්වනුයේ **කලයාණමිත්ත** යන පදයෙනි. බුදුදහම පිළිගන්නා පරිදි යමෙකුට කලයාණ මිත්‍රයෙකු ඇත්නම් ඔහු මුළුමනින් ම සුරක්ෂිත වූ පුද්ගලයෙකු වේ. නූතන ලෝකයේ ගෝලීයකරණය හා වාණිජකරණය වැනි කරුණු හේතුවෙන් මිනිසාට ස්වාධීනව අභියෝග කළ නො හැකි දැවැන්ත ගැටලු හා අර්බුදවලට මුහුණපෑමට සිදුවේ. බුදුදහමේ උගන්වනු ලබන කලයාණ මිත්‍ර සහයෝගය මෙබඳු අර්බුද ජය ගැනීම සඳහා නියත වශයෙන් ප්‍රයෝජනවත් වන බව නිගමනය කළ හැක්කේ එය මාර්ගඵලාධිගමය දක්වා උසස් තත්ත්වයන් කරා රැගෙන යාමට ඉවහල් වන බව බුදුන් වහන්සේ විසින් ම ප්‍රකාශකර ඇති හෙයිනි. එබැවින් මෙම පර්යේෂණයේ දී පාදක කොට ගැනෙනුයේ නූතන සමාජය තුළ බුදුදහම දක්වන ආකාරයේ කලයාණ මිත්‍රයන් සිටිය හැකි ද යන්න සහ එබඳු පුද්ගලයන් පිළිබඳ ජීවමාන නිදර්ශන වර්තමාන සමාජයෙන් සොයාගත හැකි ද යන්න විමසා බැලීමත් නූතන සමාජ අභියෝග සඳහා එබඳු පුද්ගලයන්ගේ දායකත්වය යොදාගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳවත් ය.

**ප්‍රමුඛ පද :** අභියෝග, කලයාණ මිත්‍රත්වය, නූතන සමාජය, බුදුදහම